# පෞද්ගලික මාධ්‍ය නියාමනයට මැදිහත් වන්නැයි

## පැෆ්රල් සංවිධානය ජනපතිගෙන් ඉල්ලයි

[දිනුක මලින්ද හේරත්]

**මැතිවරණ සමයේ රූපවාහිනී ආයතන විසින් මාධ්‍ය උපමාන අනුගමනය කිරීම අනිවාර්ය කිරීමට පියවර ගන්නා ලෙස නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය හෙවත් පැෆ්රල් සංවිධානය ජනමාධ්‍ය විෂය බාර අමාත්‍යවරයා වන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් ඉල්ලීමක් කර තිබේ.**

මැතිවරණ සමයේදී සියලුම මාධ්‍ය අනුගමනය කළ යුතු මාධ්‍ය උපමාන මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019 සැප්තැම්බර් 21 වැනි දින අංක 2141/87 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථාව යටතේ පනවා ඇති නමුත් ඇතැම් පෞද්ගලික රූපවාහිනී නාලිකාවන් එම මාධ්‍ය උපමාන සඳහා ගරු කිරීමක් සිදු නොකරන බවද එම සංවිධානය පෙන්වා දෙයි. මෙම තත්ත්වය නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු සමබර බව පවත්වා ගැනීම සඳහා බාධාවක් බව එම ලිපියේ සඳහන් වේ.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හා 2019 සැප්තැම්බර් මස 9 වැනි දින හා අංක 2140/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සියලුම රූපවාහිනී විකාශනයන් සම්බන්ධයෙන් නියාමන වගකීම පැවරී ඇත්තේ ආරක්ෂක අමාත්‍යාංශයට හා ආරක්ෂක අමාත්‍යවරයා වන ජනාධිපතිවරයාට බැවින් සියලුම රූපවාහිනී නාලිකාවන් මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමාන අනුගමනය කළ යුතු බවට වන නියෝගයක් පනවන ලෙස ඉල්ලා තිබේ. ජනාධිපතිවරයා වෙත යැවූ එම ලිපියේ පිටපත් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා වෙත සහ විදුලි සංදේශ නියාමන කොමිසමේ සභාපතිවරයා වෙතද යැවූ බව පැෆ්රල් සංවිධානය සඳහන් කළේය.